# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,693 — 1966 අප්‍රේල් 29 වැනි සිකුරාද — 1966.4.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 61 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 62 | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්‍යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම දහයේ සිට හතර දක්වාද, සෑම වරුවේ දිනවල දහයේ සිට එක දක්වාද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල සවස 3 දක්වාද, වරුවේ දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### ''ඒ'' කොටසේ හෝ ''බී'' කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ '' ඒ '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්‍යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ '' බී '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්‍යාලයීය අංකයට මුලින් '' බී '' අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරන ෆෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සැහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

## පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 අප්‍රේල් 22 වැනි දින දරණ අංක 5414**

**(1963 අප්‍රේල් 29 පූර්වතා දිනයට හිමිකම් පාන ඇමෙරිකා එක්සත් ජන පදයේ අංක 2,76,597 දරන සම්මුති ඉල්ලුම් පත්‍රය)**

JACK LIPPES

" අන්තර්–ගර්භාශයික උපකරණයක් "

**සංක්ෂේපය.**—අන්තර්-ගර්භාශයික උපකරණය දිග සුනම්‍ය ද්‍රව්‍යයකින් සමන්විත වේ. ලොකු ' S ' හැඩයකට තිබෙන්නා වූ මෙය වඩා කුඩා ' S ' ස්වරූපයක් බවට දීර්ඝ වී ඇත. මේ උපකරණය සැලකිය යුතු තරමින් දිගහැරීමට පුළුවන. අත හැරිය විට කලින් තුබූ ද්වි ' S ' ස්වරූපය සහිත වක් හැඩයට එය නැවත පත් වේ.

සංශ්ලේෂක ටෙෆ්ලොන් ප්ලාස්ටික් ද්‍රව්‍යයෙන් මෙය නිමවා ඇත. මෙය නිෂ්ක්‍රිය ද්‍රව්‍යයක් බැවින් පළඳින තැනත්තා කෙරෙහි කිසිම විදිහක ආපදාවක් ගෙන දෙන පිළිවෙලේ ප්‍රතික්‍රියාවක් ඇති නොවේ.

උපකරණය නිමවා ඇති ද්‍රව්‍යයෙන් පරිමාව අනුව 20% ක් පමණ බේරියම් සල්ෆේට් ප්‍රමාණයක් සමග ප්ලාස්ටික් ද්‍රව්‍යය මිශ්‍ර කොට ඇත. මෙය කර තිබෙන්නේ එකී මිශ්‍රණයෙන් සෑදූ ප්‍රතිරෝධක උපකරණය X–කිරණ පරීක්ෂණයේ දී පෙනෙන්ට සැලැස්වීම සඳහා ය. සුනම්‍ය දේහයේ අගට ඇති කෙටි " S " හි කෙළවරට සවිකළ සුනම්‍ය දේහ-වලිගයක් මෙයට තිබේ.

සර්පණ ප්ලංජරයක් සහිත සුනම්‍ය කොපුවක් නොහොත් නළයක් මගින් ගර්භාෂය තුළට මෙම උපකරණය ඇතුළු කරනු ලැබේ. නළයත් ප්ලංජර යත් ටෙෆ්ලොන්වලින්ම සාද තිබේ. ගර්භාෂය ඇතුළත මෙම උපකරණය මාස ගණනක් හෝ අවුරුදු ගණනක් හෝ තබා තියන්නට පුළුවන. එම කාලය පුරා ම ක්‍රියාකාරි තත්ත්වයෙන් එය පවතිනු ඇත. උපකරණය ඉවතට ගැනීමට උවමනා නම් බැහි අඩුවක් වැනි සුදුසු භාණ්ඩයකින් වලිගයේ මුක්ත කෙළවර අල්ලා අනතුරුව ගර්භාශයෙන් බැහැරට උපකරණය ඇදීමෙන් ඒ ක්‍රියාව පහසුවෙන් ඉටු කිරීමට පුළුවන.

හිමිකම් ප්‍රකාශ 10 ක් ද රූ සටහන් පතක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 පෙබරවාරි 21 වැනි දින කොළඹ දී ය.

4–897/1

---

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 මැයි 5 වැනි දින දරන අංක 5419 (63.5.9 පූර්වතා දිනයට හිමිකම් පාන එක්සත් රාජධානියේ අංක 18328/63 දරන සම්මුති ඉල්ලුම් පත්‍රය)**

UNILEVER LIMITED

" රේසර් තල "

**සංක්ෂේපය.**—මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—

1. ජලභීතික කාණ්ඩයක් දරන්නා වූ කාබනික රසායනික සංයෝගය කින් ගත් සැහෙන තරම් ඒක-අණුක ස්තරයක් ආලේප කරනු ලැබූ කැපුම් මූණතක් ඇති රේසර් තලයකි. මෙකී කාණ්ඩය සරල දම හෝ අතු දම හෝ සහිත ඇල්කිල් කාණ්ඩයකින් යුක්ත වේ. එම ඇල්කිල් කාණ්ඩයෙහි අඩු ගණනේ කාබන් පරමාණු 8ක් ද ඇල්කිල් දමයේ කෙළවර හෝ ඒ සමීපයේ හෝ අඩු ගණනේ එක ධ්‍රැවීය කාණ්ඩයක් ද අන්තර්ගත වේ. සංයෝගයේ ඇති මේ ධ්‍රැවීය කාණ්ඩ මගින් රේසර් තලයේ ලෝහයට යථොක්ත ස්තරය ඇලවී පවතී.

හිමිකම් ප්‍රකාශ 22 ක් ද නිදසුන් 6 ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 මාර්තු 25 වැනි දින කොළඹ දී ය.

4–897/2

---

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 අගෝස්තු 1 වැනි දින දරන අංක 5489 (63.8.1 පූර්වතා දිනයට හිමිකම් පාන එක්සත් රාජධානියේ අංක 30615/63 දරන සම්මුති ඉල්ලුම් පත්‍රය)**

THE WELLCOME FOUNDATION LIMITED

" ප්‍රතිශක්ත කාරක ද්‍රව්‍ය "

**සංක්ෂේපය.**—මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 3, 5, 10, 15 සහ 16 යන හිමිකම් ප්‍රකාශවලින් නිශ්චය කරගත හැකිවේ :—

3. රෝපණ මාධ්‍යයක් තුළ එස්කෙරිකියා කෝලි (Escherichia Coli) CN 5364 මාදිලිය අඩංගු බැක්ටීරිය රෝපිතයකි. මෙහි වූ මාදිලියේ LD 50 අගය එක් එක් මීයකුට ජීවීන් $10^6$ බැගින් වූ ගණනට පහළ ය. රුධිර ඒගාර් මත ස්වල්ප වශයෙන් උත්තල, ක්‍රීම් පාටට හුරු සුදු පාටැති බැබලෙන ගණාවාස යැදීමට ද 0.15 මස්තු දර්ශයක් වූ ජනක RVC 283 මාදිලියෙන් වෙන්වී සිටීමට ද ඉහත කී මාදිලියට පුළුවන.

5. 3 වැනි හෝ 4 වැනි හෝ හිමිකම් ප්‍රකාශ දෙකෙන් එකකට අනුකූල වූ බැක්ටීරිය රෝපිතයකි. මෙහි යොදන මාධ්‍යය ඩෙක්සට්–බිත්තර මාධ්‍ය යකි. නැතිනම් පෝෂ්‍ය ද්‍රාවණයකි. ඒත් නැතිනම් පෝෂ්‍ය ඒගාර් මාධ්‍යයකි.

10. එස්කෙරිකියා කෝලි ආසාදනවලට ප්‍රතිකර්ම කිරීම සඳහා හෝ ඒවා වැළැක්වීම සඳහා හෝ යොදන එන්නතකි. 3 වැනි හිමිකම් ප්‍රකාශය යටතේ අර්ථ දැක්වූ එස්කෙරිකියා කෝලි CN 5364 දරන නිෂ්ක්‍රිය කළ මාදිලියකින් මෙය සමන්විත වේ.

15. එස්කෙරිකියා කෝලි ආසාදනවලට ප්‍රතිකර්ම කිරීම සඳහා ද ඒවා වැළැක්වීම සඳහා ද යොදන එන්නතකි. 3 වැනි හිමිකම් ප්‍රකාශය යටතේ අර්ථ දැක් වූ එස්කෙරිකියා කෝලි CN 5364 දරන වැරුණු මාදිලියකින් මෙය සමන්විත වේ.

16. එස්කෙරිකියා කෝලි ආසාදනවලට ප්‍රතිකර්ම කිරීම සඳහා හෝ ඒවා වැළක්වීම සඳහා හෝ යොදන අක්‍රිය ප්‍රතිශේදක ද්‍රව්‍යයකි. 3 වැනි හිමිකම් ප්‍රකාශයේ අර්ථ දක් වූ එස්කෙරිකියා කෝලි CN 5364 මාදිළියෙන් ප්‍රතිශක්ත කළ රෝග පාත්‍රි අවලතාප සතුන්ගේ මස්තුවලින් මෙය සමන්විත වේ.

හිමිකම් ප්‍රකාශ 19 ක් ද නිදසුන් 7 ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්.

1966 මාර්තු 25 වැනි දින කොළඹ දී ය.

4–897/3

---

## දූන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 අගෝස්තු 13 වැනි දින දරන අංක 5492

PIERREL S.p.A

" නව ලවණයක් සහ කැනමයිසින් රැස්කර ගන්නා නව කාර්යක්‍රමයක් " .

සංක්ෂේපය—මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි සහ 2 වැනි හිමිකම් ප්‍රකාශවලින් නිශ්චය කරගත හැකි වේ :—

කැනමයිසින් ලෝරිල්සල්පේට් නැමැති නව රසායනික සංයෝගයෙන් නියෝජනය කැරෙන නව පදර්ථ සංයුතියකි. පහත සඳහන් විශ්ලේෂක ලක්ෂණ මෙයට තිබේ :—

| | |
|---|---|
| කැනමයිසින් මූලය වශයෙන්— | මි.ග්‍රැමයට මයි. ග්‍රැ. |
| ඖෂධ ශක්තිය | 250—300 |
| ලෝරිල්සල්පියුරික් අම්ලය | 70—75% |
| $[\alpha]_D^{25}$ | + 38° ± 2 |
| නුජොල් (Nujol) තුළ අධෝරක්ත වර්ණාවලිය | 2·95—6·15—6·62—8·3 |
| (පුළුල් පටිය) | 8·75—9·45 Mμ |

$p$H (ජලය තුළ 10% අවලම්බනය) 2 ක් පමණ

2. කැනමයිසින් ලෝරිල්සල්පේට් නිෂ්පාදනය සඳහා කාර්යක්‍රමයකි. ස්ට්‍රෙප්ටොමිසෙස් කනමිසෙටිකුස් (Streptamyces Kanamyceticus) සහිත රෝපණ ද්‍රාවණය පෙරා එයට සෝඩියම් ලෝරිල්සල්පේට් එකතු කිරීමෙන් ලවණීකෘත ආකාරයකින් කැනමයිසින් වරණීය ලෙස අවක්ෂේපණය කිරීම එම ක්‍රමය වේ.

හිමිකම් ප්‍රකාශ 6ක් ද නිදසුන් 5 ක් ද මෙහි තිබේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ට්‍රාර්,

1966 ජනවාරි 27 වැනි දින කොළඹ දී ය.

4–897/4

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සති පතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනය බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

උපලේඛනය
1966

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු ... | 66. 3. 4 | සිකුරාද | ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද | ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද | ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද | ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 66. 4. 1 | සිකුරාද | ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද | ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද | ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද | ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද | ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි ... | 66. 5. 6 | සිකුරාද | ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද | ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද | ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද | ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි ... | 66. 6. 3 | සිකුරාද | ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද | ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද | ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි ... | 66. 7. 1 | සිකුරාද | ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද | ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද | ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද | ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද | ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 පෙබරවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කම්හන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපපියි